---

## අරණායක ප්‍රාදේශීය සභාව

## කෑගල්ල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අරණායක ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, - මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

සභාව සතු ආදාහනාගාර ගොඩනැගිල්ලේ වටිනාකම රු. 10,429,917 ක් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 16,837,082 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 15,659,625 ක් වූයෙන් වෙනස රු. 1,177,457 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,078,050 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,016,239 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 560 | 521 | 467 |
| (ii) බදු කුලී | 2,015 | 1,739 | 134 |
| (iii) බලපත්‍ර ගාස්තු | 651 | 542 | 109 |
| (iv) වෙනත් ආදායම් | 25,677 | 15,672 | 15,156 |

#### 2.2.2 වෙනත් ආදායම්

(අ) 2002, 2004 වර්ෂ වලට අදාලව සති පොල හිඟ ආදායම් රු. 55,672 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොදු වෙළඳපල අංක 02 කුකුළු මස් කඩය 2012 වර්ෂයට බදු දීම වෙනුවෙන් බදුකරු සමඟ ගිවිසුමකට එළඹී නොතිබූ අතර, අංක 01 හා 02 දරන කුකුළු මස් කඩ වලින් හා අංක 01 දරන මාළු කඩයෙන් 2000, 2001, 2004 වර්ෂ වලට අදාලව රු. 58,934 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පොදු වෙළඳපල අංක 01 හා 02 දරන මාළු කඩ වලින් පිළිවෙලින් රු. 285,100 ක් හා රු. 285,000 ක වාර්ෂික ආදායමක් අපේක්ෂිතව තිබුණද, නැවත ටෙන්ඩර් කර බදු දීමට ක්‍රියා කර නොතිබීමෙන් පිළිවෙලින් රු. 213,825 ක් හා රු. 71,250 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 560,000 |
| (ii) මුද්දර ගාස්තු | 5,704,648 |

2.3 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

වටිනාකම රු. 1,056,128 ක් වූ ට්‍රැක්ටර් දෙකක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතින.

2.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

2011, 2012 වර්ෂ වලට අදාලව අනවසර ඉදි කිරීම් 03 ක් සම්බන්ධයෙන් සභාව විසින් ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) තොග පාලනය